# බරාදිය ජාතකය

තවද එක් සමයෙක් හි සර්වඥයන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, එක්තරා අකීකරු භික්ෂුකෙණෙකුන් අරභයා මේ ජාතකය වදාළ සේක. ඒ භික්ෂුන් වහන්සේ වනාහි අකීකරුය අවවාදය නොගන්නා සේක. ඉක්බිත්තෙන් සර්වඥයන් වහන්සේ ඒ භික්ෂුන් වහන්සේට වදාරණ සේක් මහණ තෙපි අකීකරුව අවවාද නොගන්නේ සැබෑද කිම්දැයි. වදාළ සේක. භාග්‍යවතුන් වහන්ස සැබැවයි දැන්වූසේක. සර්වඥයන් වහන්සේ මහණ තෝ පූර්වයෙහිත් අකීකරු බැවින් ප්‍රඥාවන්තයන්ගේ අවවාද නොගෙණ මලෙහි බැඳුනේම ජීවිතක්‍ෂයට පැමිණියෙහියයි වදාරා ඉකුත් වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත  නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහා බෝසතානන් වහන්සේ මෘග ජන්මයෙහි ඉපිද මෘගසමූහයා විසින් පිරිවරණ ලදුව අරණ්‍යයෙහි වසන සේක. ඉක්බිත්තෙන් බෝධිසත්වයන් වහන්සේට නැගණී වූ මෘගධෙනුවක් පුත්‍රයකු දක්වා බෑයන් වහන්ස මේ තෙම නුඹවහන්සේගේ බෑනා වන්නේය. මොහට මෘග මායම් උගන්වන සේක්වයි කියා භාරකළාය. බෝධිසත්වයන් වහන්සේ ඒ බෑණා වූ මෘග පෝතකයාට  අසවල් වේලාවෙහි අවුත් උගනුවයි කී සේක. මෘග පෝතක තෙම කියන ලද වේලෙහි නොඑන්නේය. යම්සේ එක්දවසක් එසේම සත් දවසක් සත් අවවාද ඉක්මවා ඒ මෘග පෝතකයා මාගමායම් නොඉගෙණ හැසිරෙණුයේ මලෙහි බැඳුනේය. ඒ මෘග පෝතකයාගේ මෑණී තොමෝ භ්‍රාතෘවූ මෘගයා කරා එළඹ භ්‍රාතෘන් වහන්ස කිමෙක්ද බෑණා වූ මෘගයා මුව මායම් උගන්වන ලද්දේදැයි විචාළීය. බෝධිසත්වයන් වහන්සේද ඒ අනොවාදක මෘගපෝතකයාගේ කාරණය නොසිතව තොපගේ පුත්‍රයා විසින් මුවමායම් නොඋගන්නාලදැයි කියා දනුදු ඕහට අවවද දෙන්නට නොකැමැතිව මෙසේ කී සේක. බරාදිය නම් තැනැත්තිය එකී එකී පාදයෙහි දෙකක් දෙකක් බැගින් අටකුරයක් ඇති මුලින් වක්ව අගින් ඉතා වක්වූ අං ඇති හෙයින් වංකාතිවංක නම් වූ සප්ත අවවාද කළායෙන් ඉක්මුණු ඒ මෘගයාට අවවාද කරන්ට උත්සහ සිතක් නැත්තේම් කීසේක. ඉක්බිත්තෙන් ඒ අකීකරු මෘගයා මලෙහි බැඳුනු කල්හි වැදි පුත්‍රතෙම මරා මාංස ගෙණ ගියේය. ශාස්තෘ වූ බුදු  රජානන් වහන්සේ වදාරණ සේක් මහණ තෝ අකීකරු වූයේ දැන්මතු නොවෙයි පූර්වයෙහිත් අකීකරු වූයෙහියයි වදාරා මේ ධර්ම දේශනාව ගෙණහැර දක්වා පූර්වාපර සන්ධි ගලපා මේ ජාතකය සමාප්ත කොට වදාළ සේක. එසමයෙහි බෑනා වූ මෘගයා නම් දැන් මේ අකීකරු මහණ වූයේය. නැගණීවූ මෘගධෙනු තොම උපුල්වන් මහාස්ථවිරි වුවාය. අවවාද දුන් මෘගව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම් ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.